# සාම්ප්‍රදායික මීමුරේ ගම්මානයේ ඓතිහාසික පසුබිම පිළිබඳ ජනප්‍රවාද ඇසුරෙන් කරනු ලබන අධ්‍යයනයක්

පී.ආර්.ඒ.එස්. හපුගොල්ල*, ඩබ්.එච්.එන්. උදාරා, කේ.එම්.එස්.පී. කරුණාතිලක

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
ashinisachinthana@gmail.com*

**මුඛ්‍ය පද** - මීමුරේ ගම්මානය, මධ්‍යම පළාත, ජනප්‍රවාද, ග්‍රාමීය ලක්ෂණ

## හැඳින්වීම

අතීත සභ්‍යත්වය මැනවින් ප්‍රතිනිර්මාණය වන ග්‍රාමයන් ආදි ලංකාව තුළ පැවතියේ ඓතිහාසික රාමුව මැනවින් ප්‍රතීයමාන කරමිනි. එවැනි ග්‍රාමයන් අතුරින් මීමුරේ සාම්ප්‍රදායික ග්‍රාමය මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි අපූර්වතම නිර්මාණයකි. මීමුරේ ඓතිහාසිකත්වය පෙන්වාලන සිද්ධිදාමය අතුරින් ජනප්‍රවාදයන්ට හිමිවන්නේ මූලික ස්ථානයකි. මුඛ පරම්පරාවෙන් සම්ප්‍රේෂණය වන්නා වූ විවිධ ජනප්‍රවාද මෙම මීමුරේ ගම්මානය කේන්ද්‍ර කර ගනිමින් ගොඩනැගී පවතින ආකාරය වර්තමාන වන විට ද දක්නට ලැබේ. මෙහි පර්යේෂණ ගැටලුව ලෙස මීමුරේ ගම්මානයේ ඓතිහාසික පසුබිම ජනප්‍රවාද ඇසුරෙන් විමර්ශනය කළ හැකිද? යන්න වේ. ජනප්‍රවාද ඇසුරින් මීමුරේ ගම්මානයේ ඓතිහාසික පසුබිම හඳුනා ගනිමින් ඒවා විමර්ශනය කොට දැක්වීම මෙම පර්යේෂණයේ අරමුණ වේ.

## ක්‍රමවේදය

මෙම පර්යේෂණයෙහි අධ්‍යයන ක්‍රමවේදය ලෙස දත්ත රැස් කිරීමේ දී සම්මුඛ සාකච්ඡා හා ක්ෂේත්‍ර අධ්‍යයනය සිදු කරන ලදි. රැස් කරගත් දත්තයන් සංසන්දනාත්මකව හා විශ්ලේෂණාත්මක අධ්‍යයනයෙන් සාම්ප්‍රදායික මීමුරේ ගම්මානයේ ඓතිහාසික පසුබිම ජනප්‍රවාද ඇසුරෙන් හඳුනා ගැනීම සිදු කරන ලදි.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

මෙම ප්‍රදේශය පිළිබඳ අධ්‍යයනයේ දී ජනප්‍රවාද ලෙස පැවතීගෙන පැමිණි මුඛ පරම්පරාගත කතා රාශියක් හඳුනා ගැනීමට හැකි විය. ඊ.එච්. මුදලි ට අනුව "මීමුරේ" යන නම සෑදී ඇත්තේ දුෂ්කර ගමන් මාර්ගයක් නිසාවෙන් මෙහි පැමිණෙන සියල්ලන් "මේ මුරේ පමණක් පැමිණෙනවා, නැවත පැමිණෙන්නේ නෑ" යනුවෙන් සඳහන් කළ බැවින් මීමුරේ වූ බවයි. එච්.එම්. රංමැණිකා පවසන පරිදි වෙල්ලස්සේ සිට පැමිණි හිටිහාමි හා හේරත්හාමි යන සොයුරන් දෙදෙනා එකල මෙම ප්‍රදේශයේ හතර මායිම ආරක්ෂා කරගෙන සිටි බේදුරුවා නම් වූ වැද්දා මරා දමා පාලනය තමා වෙත ලබාගෙන ඇත. වටලානහාමි නම් කාන්තාව සමඟ විවාහ වූ මොවුන් දෙදෙනා මෙම ප්‍රදේශයේ වාසය කරමින් සිටින අවස්ථාවේ හිටිහාමි තම සොහොයුරාට වටලානහාමි සමඟ මෙහි ජීවත් වන්නට යැයි පවසා ඔහු වෙන ප්‍රදේශයකට ගොස් ඇත. මේ මුරේ පමණක් තමා එන බවත් නැවත මුරයක් එන්නේ නැතැයි පැවසූ නිසාවෙනුත් මීමුරේ ලෙස හඳුන්වා ඇත. ඩී.කේ.ජී. මුතුබණ්ඩාට අනුව මීයකට මුර කෙරූ නිසාවෙන් මීමුරේ ලෙස හඳුන්වා ඇත, මීමුරේ ප්‍රදේශය ආශ්‍රිතව පවත්නා වූ ඓතිහාසික තොරතුරු රාශියක් මීට අමතරව හඳුනා ගැනීමට හැකි විය. මීමුරේ සිංහල උළු භාවිතා කරමින් උඩරට වාස්තුවිද්‍යාවට අනුකූලව පාරම්පරික නිවසක් සකසා ඇත. මෙම නිවසෙහි අයිතිකරු වන ආර්.එම්. උඩවලවේ රංජිත් මහතා 1972-1975 අතර කාලයේ දී මෙම නිවසෙහි පදිංචි ව සිට ඇත. ඔහු පවසන පරිදි මෙම නිවස උඩරට දෙවන රාජසිංහ රජුගේ බිසෝවරු දෙදෙනා සැඟව සිටි ස්ථානය මෙය වන අතර රජු විසින් ඔහුගේ මුද්‍රාව සහ ඔටුන්න සලකුණ ඇති තවත් ආභරණයක් එහි වලදමා තිබේ. ඊ.එම් මුදලි පවසන්නේ මීමුරේ ප්‍රදේශය රාවණා රජු සැඟව සිටි ස්ථානයක් වන බවයි. රාවණා රජු යුද්ධයෙන් පැරදී සැඟවී

සිට ඇත්තේ ලකේගල කන්දෙහි ගල්ගෙයක ය. "පස්සෙ කාලක සුදු මහත්තරු ගලේ නගිද්දි ඒ ගුහාව අපට හම්බෙලා ඒකේ ඉදන් අපි අඩියක් ගහලා සප්පායම් උනා. පස්සේ සුදු මහත්තරු අපිට ඒ ගුහාව කොළ අතුවලින් සුද්ද කරලා පාදන්න කියලා කිවුවා. හැබැයි වැඩි දුර යන්න උන්නෑ හරිම කලුවරයි" යැයි, මුදලි අනාවරණය කළේය. ඩී.කේ.ජී. මුතුබංඩා පවසන පරිදි උඩුදුම්බර ප්‍රදේශයේ ලකේගලෙහි රාවණා සැගවී සිට ඇති අතර එම ප්‍රදේශයේ සීතා දේවියගේ ආභරණ සඟවා තබා ඇත.

මීමුරේ ප්‍රදේශයේ ඓතිහාසික පසුබිම පිළිබඳ විමර්ශනය කිරීමේ දී පවුල් පරම්පරාවන් පිළිබඳ අධ්‍යයනය  කිරීම සිදු විය. එහි දී නියැදි වශයෙන් පවුල් කීපයක් තෝරාගනු ලැබුව ද නිවැරදි තොරතුරු ලබා ගැනීමට අපහසු වූ නමුත් ඩී.කේ.ජී. මුතුබණ්ඩාගේ පවුලෙහි පරම්පරා හතක් දක්වා හඳුනා ගැනීමට අධ්‍යයනයේ දී හැකි විය. ඒ අනුව ඔහුගේ පවුලෙහි පරම්පරාව, අධ්‍යයනයේ පහසුව සඳහා පහත පරිදි සැළසුම් කර දැක්විය හැක.

එමෙන් ම මීමුරේ ප්‍රදේශය ආශ්‍රය කර ගනිමින් බිහි වූ විවිධ ජනශ්‍රැතීන් පවතින අතර එවැනි පද්‍යය කිහිපයක් එච්.එම් රංමැණිකා විසින් ගායනා කෙරිණි.

| | | | |
|---|---|---|---|
| මී මුරේ ගමට නිසි ඔබිනා | ලකේගල | සිතට තිබුණු කරදරවලින් | නිසාවට |
| ඩැත්තාවට නිසි ඔබිනා | යහන්ගල | ලකේගල කන්ද නැගලා වෙහෙසුණි අපට | |
| නාරංගලට නිසි ඔබිනා | කොරොස්ගල | සක්වල පිපාසය සැදුරන් දිය | බොන්ට |
| මේ ගම් තුනෙන් නායක ගල | ලකේගල | අත්තලමෙට්ටුවට ළං වුනේ තේ | බොන්ට |

මෙකී ගායනාවන් ට අනුව මීමුරේ ගමට අනන්‍ය ඓතිහාසික වටිනාකමක් ලබා දෙන්නා ස්ථානයක් ලෙස ලකේගල කන්ද හැඳින්විය හැක.

මීමුරේ ප්‍රදේශය ආශ්‍රිතව පවත්නා වූ ජනප්‍රවාද පිළිබඳ විමර්ශනය කිරීමේ දී එහි ප්‍රතිඵල වැදගත් වන අතර එමඟින් ඓතිහාසික පසුබිම පිළිබඳව හඳුනාගත හැක. ජනප්‍රවාද ජනයා විසින් මුඛ පරම්පරාගතව රැගෙන පැමිණියා වූ විස්තරයන් තොරතුරු වේ. මේවායෙහි වැරදි නිවැරදි බව අවිනිශ්චිතය. මෙම තොරතුරු විවිධ පුද්ගලයින් විසින් ඔවුන්ට ඇසූ දුටු අයුරින් ඔවුන්ගේ බුද්ධියට අනුව ග්‍රහණය කරගත් දේවල්වලින් සමන්විත බැවින් මානව කේන්ද්‍රවාදී අදහස් ද තිබිය හැක. මීමුරේ ප්‍රදේශයේ ජීවත් වන්නා වූ පුද්ගලයින්ගේ අත්දැකීම් හා මුඛ පරම්පරාගතව පැමිණි තොරතුරුවලට අනුව මෙම ප්‍රදේශයෙහි රාවණා රජු ලකේගල කන්දෙහි සැඟවී සිටි අතර බේදුරුවා නම් වැද්දා පිළිබඳව ද කරුණු නිගමනය කර ගත හැක. වර්තමානයේ දී පවා බේදුරුවා නම් වැද්දා සඳහා විවිධ පුද පූජා පවත්වනු ලැබේ. මීමුරේ ගම්මානයේ පවත්නා වූ ජනප්‍රවාදයන් පිළිබඳව අධ්‍යයනයේ දී පැහැදිලි වන කරුණක් වනුයේ ලකේගල කන්ද පිළිබඳව සඳහන් වී තිබීමයි. ඒ අනුව පැහැදිලි වනුයේ ලකේගල කන්ද මීමුරේ වැසියාගේ එදිනෙදා ජීවිතය සමඟ සම්බන්ධ වී ඇති බවයි. සම්මුඛ සාකච්ඡාවලින් ලබාගත් දත්ත විමර්ශනයේ දී විෂමතාවයක් පවතින බවත් මෙම පර්යේෂණයට අනුව ජනප්‍රවාද ඇසුරින් සාම්ප්‍රදායික මීමුරේ ගම්මානයේ ඓතිහාසික පසුබිම විමර්ශනය කළ හැකි බවත් නිගමනය කළ හැක.

**ආශ්‍රිත මූලාශ්‍රය**

**(සම්මුඛ සාකච්ඡා)**

එච්.එම්. රන්මැණිකා, (අවු. 72) 2023 ජූනි 13.

ආර්.එම් උඩවලවේ, (අවු. 66) 2023 ජූනි 13.

ර්.එම්. මුදලි, (අවු. 93) 2023 ජූනි 13 .

ඩී.කේ.ජී මුතුබණ්ඩා, (අවු. 78) 2023 ජූනි 13.